**සමූපකාර සංවර්ධන අරමුදල - 2022**
**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමූපකාර සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කල මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ආදායම රු.37,806,761 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල දායක මුදල් ආදායම් ලෙස රු.35,029,761 දක්වා තිබීමෙන් දායක මුදල් ආදායම රු.2,777,000 ක් අඩුවෙන් දක්වා තිබුණි . | ගිණුම් අංශය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම් ප්‍රමාදයක් මත මෙම ගැටලුව සිදු වී ඇත. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතුකල යුතුය. |
| (ආ) | ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.121,945,590 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ලැබිය යුතු දායක මුදල් රු.119,458,972 ක් ලෙස රු.2,486,618 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉහත සඳහන් පිළිතුර අදාළ වේ. | -එම- |
| (ඇ) | ඉදිරියට ලැබූ දායක මුදල් ශේෂය රු.2,007,744 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස ඉදිරියට ලැබූ දායක මුදල් රු.2,298,123 ක් ලෙස රු.290,379ක් වැඩිපුර දක්වා තිබුණි. | ගිණුම් අංශය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම් ප්‍රමාදයක් මත මෙම ගැටලුව සිදු වී ඇත. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | සමුපකාර සමිති ණය | 46,747,217 | ශේෂ සනාථන | මේ සඳහා ශේෂ සනාථන ඉදිරිපත් කරන ලෙසට සමිති දැනුවත් කර ඇතත් ශේෂ සනාථන ඉදිරිපත් කර නොමැත. | ශේෂ තහවුරු කර ගැනීමට අදාල සනාථන පැවතිය යුතුය. |
| (ආ) | නොපියවූ අත්තිකාරම් | 45,525 | ශේෂ සනාථන | මේ සම්බන්ධව තොරතුරු සොයා ගැනීමේ ගැටලුව මත ශේෂ සනාථන ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | -එම- |
| (ඇ) | අතිරික්ත අරමුදල මාරු කිරීම | 20,000 | ශේෂ සනාථන | -එම- | -එම- |
| (ඇ) | ණය ලබාදීම ඌව පලාත | 5,439,905 | ශේෂ සනාථන | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.79,412,313 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.68,573,375 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,838,938 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දායක මුදල් ආදායම රු. 36,716,953 කින් අඩු වුවද, ආයෝජන පොලී ආදායම් රු.43,840,907 කින් හා විවිධ ආදායම් රු.2,629,917 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **සමුපකාර සමිති ණය** | | |
| (i) 2022 ජනවාරි 01 දිනට අක්‍රීය සමුපකාර සමිති 54කින් රු.31,287,451 ක් හා සක්‍රීය සමිති දෙකකින් රු.3,016,480 ක්ද වශයෙන් එකතුව රු.34,303,931 ක හිඟ ණය ශේෂය පැවතියද, සමාලෝචිත වර්ෂයේදී රු. 57,297 ක ණය වාරික මුදලක් පමණක් අය වී තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සමුපකාර සමිති ණය රු.34,019,114 ක් හා පොළිය | මෙම ණය ඉතා පැරණි ණය වන අතර පළාත් කොමසාරිස්වරුන් විසින් නම් කර ඒවන ලද නිලධාරීන් සහ සමිති සමඟ සම්බන්ධවෙමින් මෙම අයකිරීම් කටයුතු සිදු කරගෙන යනු ලබයි .<br><br>සක්‍රිය ණය යටතේ ඇති කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියට ලබා දුන් ණය | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.8,346,192 ක් විය. එම ණය හා පොලිය අතර වර්ෂ 21 ක සිට වර්ෂ 58 ක් දක්වා කාල පරාසයක සිට අය නොවී පවතින ශේෂයන්ද වූ අතර, ඉන් සමිති 18 කට ලබාදුන් රු.8,420,900 ක් වූ ණය මුදලින් කිසිදු ණය වාරිකයක් අය වී නොතිබුණි. තවද 2012 වර්ෂයේදී සීමාසහිත කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියට ලබා දී තිබූ රු.3,000,000 ක් වූ ණය මුදල වාරික 54 කින් ගෙවා නිම කල යුතුව තිබුණද, එම ණය මුදලින් 2013 වර්ෂයේදී එක් වාරිකයක් පමණක් ගෙවා තිබුණි. | සම්බන්ධයෙන් නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | |
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමූපකාර විදුහල් ණය,2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,838,512 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.1,021,459 ක් වූ ලැබිය යුතු උසාවි වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1997 වර්ෂයේ සිට පැවත එන ණය සම්බන්ධව නිශ්චිත තොරතුරු සොයාගත නොහැකි වීමෙන් නිරවුල් කිරිමේ ගැටලු පවතී.<br><br>2012 වර්ෂයට පෙර සිට පැවත එන ලැබිය යුතු කාර්යසාධන අත්තිකාරමෙන් කොටසක් නිරවුල් කරන ලදි.ජාතික සමූපකාර සංවර්ධන ආයතනය මඟින් ලද තහවුරු කිරීම් මත ඉතිරි ශේෂය නිරවුල් කිරීමට ද ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.<br><br>රු.1,021,459 ක ලැබිය යුතු උසාවි වන්දි මුදලින් මාසිකව රු.11,607 ක මුදලක් අයවෙමින් පවතී.2023 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට රු.208,969 ක මුදලක් අය වී ඇත. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.119,458,972 ක් වූ අතර, ඉන් රු.61,319,008ක් හා රු.17,295,927 ක් වශයෙන් එකතුව රු.78,614,935 ක් එනම් සියයට 66ක ඉහළ ප්‍රතිශතයක් සීමාසහිත සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් හා සීමාසහිත සමූපකාර රාජ්‍ය සේවා සණස යන සමිති දෙකෙන් අයවිය යුතුව පැවතුණි. ලැබිය යුතු දායක මුදල් ශේෂය තුල සමිති 12 කින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දායක මුදලක් ලැබී නොතිබුණු අතර එම ශේෂය රු.5,394,642 ක් විය. | මේ වන විටත් දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ උපදෙස් පරිදි කටයුතු කරමින් පවතින අතර ඉදිරි මාස 02 තුළ සමිති සමඟ සාකච්ඡාකර මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) **චක්‍රීය අරමුදල**

| | | |
|---|---|---|
| (i) අරමුදලින් පළාත් සමුපකාර සංගම් 09 ක් සඳහා 2010 වර්ෂයේ සහ 2011 වර්ෂයේදී රු.මිලියන 290 ක ණය මුදලක් ලබා දී තිබුණි. එම ණය මුදල් අතර උතුරු මැද පළාත් පාරිභෝගික සංගමයට ලබා දී තිබූ ණය මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය වාරික වලින් රු. 7,126,500 ක් හා ඌව පළාත් පාරිභෝගික සංගමයට ලබාදුන් ණය මුදල් වලින් රු.800,000 කින් කිසිදු වාරිකයක් අයවී නොතිබුණි. | අය විය යුතු ණය මුදල් වලින් උතුරු මැද පළාත් පාරිභෝගික සංගමයට සහ ඌව පළාත් පාරිභෝගික සංගමයට ලබා දුන් ණය මුදල් පමණක් අය කිරීම් ගැටලුවක් පවතී. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2011 හා 2012 වර්ෂවල සමුපකාර පාරිභෝගික සංගමයට ලබා දී තිබූ ණය මුදල් වල වටිනාකම රු.මිලියන 166 ක් වූ අතර එම මුදලින් 2022 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු මුදල් රු.මිලියන 44 ක් විය. එම ණය ගිවිසුම් අනුව ණය ලබාගෙන මාසයක් හෝ මාස දෙකක් ඇතුලත එම ණය පියවිය යුතු බව සඳහන් කර තිබුණත් වසර 10 ක් ගත වී තිබුණත් එම ණය අයකර ගැනීමට කටයතු කර නොතිබුණි. | සමුපකාර පාරිභෝගික සංගමයට ලබා දුන් ණය අය කිරීම සම්බන්ධව නිරන්තර දැනුවත් කිරීම් සිදු කළ නමුත් එම ණය අය කිරීමේ ගැටලු පවතී. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) 2011 වර්ෂයේදී සමුපකාර අලෙවි සංගමයට ලබා දී තිබූ රු.මිලියන 50 ක ණය මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 20.4 ක් හිඟව පැවතුණු අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමුපකාර අලෙවි සංගමයට ලබා දුන් ණය අය කිරීම සම්බන්ධව නිරන්තර දැනුවත් කිරීම් සිදු කළ නමුත් එම ණය අය කිරීමේ ගැටලු පවතී. | -එම- |
| (iv) සමුපකාර සංවර්ධන අරමුදලින් 2011 වර්ෂයේදී රු.මිලියන 152.5 ක් සමුපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබුණි. එම මුදලින් 2012 වර්ෂයේදී රු.මිලියන 60 ක් පමණක් අය වී තිබුණු අතර,2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92.5 ක් විය. | මේ සම්බන්ධව රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා මාර්ගයෙන් සමුපකාර තොග වෙළඳ සංස්ථාව 2022.01.13 දින දැනුවත් කර ඇත.කෙසේ වුවද මේ සම්බන්ධව මේ වනතෙක් යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත. | -එම- |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතේ 43 (අ) වගන්තිය | එකඟ වන බව. | සමුපකාර සමිති පනත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ලබා |

| | | | |
|---|---|---|---|
| | අනුව සෑම ලියාපදිංචි සමිතියක්ම, සමිතියේ ආදායම, වියදම, වත්කම්, බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වාගෙන යා යුතු අතර ඒ ගිණුම් ප්‍රකාශ එය අදාළ වන මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුලත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු වෙත බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත ඉදිරිපත් කළ යුතු වේ. 2022 වර්ෂය අවසන් වන විට සමිති 53 ක්ද සංගම් 16 ක්ද ලියාපදිංචි වී තිබිණි. නමුත් ඒ අතරින් 2021 වර්ෂය සඳහා සමිති 32 කින් හා සංගම් 05 කින් ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. | | ගැනීමට ක්‍රියාකල යුතුය. |
| (ආ) | 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත 43(ආ) කොටසේ 1,2,3 අනුකොටස් දක්වන පරිදි සෑම ලියාපදිංචිකළ සමිතියක් විසින්ම අයවැය ලේඛනයක් පිළියෙල කර එය අදාල වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර මාසයකට කලින් සමිතියේ මහා මණ්ඩලය මඟින් අනුමත කර එහි පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. නමුත් 2022 වර්ෂය සඳහා ලියාපදිංචි සමුපකාර සමිති 53 ක් සහ සංගම් 16 ක් අතරින් සමිති 48 කින් හා සංගම් 12 කින් අයවැය ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | සමුපකාර සමිති පනතේ පවතින ප්‍රතිපාදන අනුව සමිති/සංගම්වල ඉදිරි වර්ෂය සඳහා වූ සංවර්ධන සැලසුම් හා අයවැය ඇස්තමේන්තුව සඳහා සමිති/සංගමයේ මහසභා අනුමැතිය ලබා ගැනීමටත් අනතුරුව එම ලේඛනයේ සහතික කරන ලද පිටපතක් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස සමිති අධීක්ෂණ නිලධාරීන් විසින් උපදෙස් ලබා දී ඇත. | සමුපකාර සමිති පනත ප්‍රකාරව අයවැය ලේඛණ ලබා ගැනීමට ක්‍රියාකල යුතුය. |
| (ඇ) | 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත යටතේ 66 (අ) (1) වගන්තිය අනුව ලියාපදිංචි සමුපකාර සමිතියක සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයකු විසින්ම, වාර්ෂිකව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු වුවත් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලියාපදිංචි සමිති හා සංගම් 69 කින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබුණේ ලියාපදිංචි සමිති සහ සංගම් 07 ක් පමණි. | දෙපාර්තමේන්තුව මඟින් සෑම විටම මේ පිළිබඳව සමිති/සංගම් ලිඛිතව දැනුවත් කිරීම් සිදු කරනු ලබන අතර,එම දැනුම් දීම් මත ප්‍රතිචාර දක්වා ඇත්තේ සමිති 07 ක් පමණි.ඒ අනුව මෙම සමිති/සංගම් නැවත දැනුවත් කර වත්කම්/වගකීම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සමුපකාර සමිති පනත ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට ක්‍රියාකල යුතුය. |